ජා-ඇල ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
---------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජා-ඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් පොතේ ශේෂය හා ගිණුමේ දක්වා තිබූ මුදල් ශේෂය අතර වූ රු.346,065 ක වෙනස බැංකු සැසඳුම මගින් ගැලපීම් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.379,650 ක් වැය කරමින් සභා අරමුදලින් ඉදිකරන ලද කෑස්වත්ත බහුකාර්ය ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිළදීගත් පුස්තකාල පොත්වල වටිනාකම වූ රු.5,849 ක් සහ කැනපි හට් වටිනාකම වූ රු.70,000 ක් ප්‍රාග්ධන වියදම් යටතේ දක්වා තිබුණද, ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) රු.1,344,876 ක්වූ වත්කම් විෂයයන් 05 ක වටිනාකම ප්‍රාග්ධන වියදම් ලෙස දැක්විය යුතු වුවත්, පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) බටුවත්ත උප කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත්ව තිබූ වත්කම් 02 වටිනාකම වූ රු.200,000 ක් ගිණුම් ගතකොට නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම රු.415,505,835 ක් වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ සහ පරිත්‍යාග යන ගිණුම් ශේෂයන් දෙකේ එකතුව රු.415,832,932 ක් විය.

(උ) ස්ථාවර තැන්පත්වල ඇති සේවක ඇප රු.15,000 ක් දීර්ඝ කාලයක සිට ගිණුම්වල දක්වා තිබුණද, එවැනි ස්ථාවර තැන්පතුවක් ආයතනය සතුව නොතිබුණි.

1.3.2 තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

එකතුව රු. 115,725,427 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.211,594,176 ක් වූ අතර, ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.117,192,366 ක් වූයෙන් රු.94,401,810 ක වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු ගිණුම

---------------------

(අ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟ විදුලි ගාස්තු රු.2,193,449 ක්ද රු.27,282 ක දඩ මුදල් ශේෂයක්ද 2009 වර්ෂයට පෙර සිට පැවත එන රු.4,418,922 ක හිඟ පෙර මුදල් ශේෂයක්ද අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ගිණුම්වල දිගින් දිගටම ඉදිරියට එමින් පවතින එකතුව රු.3,180,223 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් මංමාවත්වල සැලැස්මක් පිළියෙල කර නාම ලේඛණයක් ගැසට් නිවේදනයක් මගින් පළකර සභා අයිතියට පවරාගත යුතු වුවත්, සභාව සතු මංවාවත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු නිලධාරින් 18 දෙනෙකු ඇප තබා නොතිබුණි.

(ඇ) 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් අංක.364 (3) දරන චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර ආයතනයක් විසින් ගෙවනු ලබන රු.25,000 ට වැඩි එකතු කල අගය මත බදු ගෙවීම් සම්බන්ධ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු වුවද, 2015 ජනවාරි සිට ජූනි දක්වා රු.2,694,385 ක් වූ එකතු කල අගය මත බදු සම්බන්ධයෙන් විස්තර යවා නොතිබුණි.

(ඈ) 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වසර 05 කට වරක්වත් කඩකුලී සංශෝධනය කලයුතු වුවත්, ප්‍රාදේශීය සභාවේ අවසන් කඩකුලී තක්සේරුව 1995 වර්ෂයේදී සිදුකර තිබුණි.

1.3..6 අවිනිශ්චිත ගිණුම්
----------------------

2015 දෙසැම්බර් 31 දිනට රු.36,425 ක් වූ අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය වර්ෂ ගණනාවක සිට ඉදිරියට පැවත එන නමුත්, එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.9,946,112 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු10,732,401 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
--------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) | වරිපනම් හා වරෙන්තු දඩ | 93,540 | 48,442 | 35,092 |
| (ii) | බදු කුලී | 14,302 | 13,921 | 10,195 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,877 | 4,313 | 153,178 |
| (iv) | වෙනත් ආදායම් | 99,724 | 153,178 | 1,145 |
| | **මුළු එකතුව** | **212,443** | **219,854** | **199610** |

2.2.2 වරිපනම් බදු

--------------

(අ) 1987 අංක.15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව වසර පහකට වරක් වරිපනම් බදු තක්සේරු ප්‍රතිශෝධනය කරගත යුතු වුවත් සභාවේ අවසන් වරට වරිපනම් තක්සේරුවක් සිදුකර තිබුනේ 2002 වර්ෂයේදී විය.

(ආ) 1987 අංක.15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාර රු.35,092,424 ක හිඟ වරිපනම් බදු ශේෂය අයකර ගැනීම කෙරෙහි සභාව අවධානය යොමු කර නොතිබුණි

2.2.3 වෙනත් ආදායම්

------------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රාගම උප කාර්යාලයට අයත් රු.6,320,752 ක්වූ ලැබිය යුතු මස් වෙළඳසැල් හා සතිපොළ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඳාන උප කාර්යාලයට අයත් 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂයවූ රු.201,650 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-------------------

(අ) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය ඇතුලත් වන ලෙස සංයුක්ත සැලැස්මක් සකස් කොට නොතිබුණි

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ප්‍රජා සෞඛ්‍ය අංශයේ ක්‍රියාකාරකම් 25 ක්ද.කර්මාන්ත හා සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් 19 ක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාවේ සාමාන්‍ය මාසික මුදල් ශේෂය රු.49,100,153 ක් පැවතුණද, මෙම මුදලින් කොටසක් හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 පාරිසරික ගැටළු

--------------------

(අ) 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ වූ නියමයෙහි උපලේඛන 2හි 4.1 ඡේදය යටතේ සෑම අලුත් කිරීමේ අයදුම් පත්‍රයක්ම බලපත්‍ර කාලය අවසාන වන දිනයට යටත් පිරිසෙයින් තුන් මසකට පෙර අදාල පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබූ අතර ඉහත නියමයෙහි 3.1.4 වගන්තිය යටතේ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ඇති අවස්ථාවන්හීදී එම වාර්තා ගණන නොසලකා අවම වශයෙන් මසකට වරක්වත් මෙම කමිටුව රැස්කල යුතු වුවත්, පරීක්ෂා කල දිනයෙන් පසුව බලපත්‍ර 04 ක් ලබාදීම ප්‍රමාද වී තිබුණි.

(ආ) ඉහත නියමයන්හි 7.2 වගන්තිය යටතේ තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව විසින් මසකට වරක් ඉහත කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කර වාර්තා කිරීමේ වැඩ පිළිවෙලක් සැකසිය යුතු වුවත් එවැනි වැඩපිළිවෙලක් සකස් කර නොතිබූ අතර එහි 7.3 වගන්තිය යටතේ ඉහත ප්‍රගති වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා අනිවාර්යෙන්ම පළාත් පාලන කොමසාරිසරයා වෙත යොමු කල යුතු වුවත් එසේ යොමුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතු හා යහපාලනය
----------------------------------

4.1 අයවැය පාලනය
-----------------------

(අ) සභා බල ප්‍රදේශය තුළ වෙසෙන මහජනතාවයගේ සුභ සාධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සේවා සැපයීමට රු.4,847,500 ක් මුදල් වෙන්කර ගෙන තිබුණි. රු.3,365,000 ක් වෙන් කරගෙන තිබූ සේවා ශීර්ෂ 04 කින් 2015 දෙසැම්බර් 31 දින වන විටද සේවාවන් සපයා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 36 ක රු.12,240,500 ක් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

4.2 අභ්‍යයන්තර විගණනය

--------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අයවැය පාලනය.
(ඈ) ආදායම් පරිපාලනය.
(ඉ) වත්කම් කළමනාකරණය.